## හක්මන ප්‍රාදේශීය සභාව

හක්මන ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සපුරා ඇති හක්මන ප්‍රාදේශීය සභා සීමාව තුළ ස්ථිර පදිංචි ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *බඳවා ගැනීමේ අවම අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|
| ආදාහනාගාර සහායක (ආදාහනාගාර ක්‍රියාකරු සහායක) | 01 | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයන් හය (06) ක් සමත් වී තිබිය යුතුය. |

*වැටුප් කේතය* : - PL 1 - 03/2016

*වැටුප් ක්‍රමය* :- රු. 24,250 - 10×250 - 10×270 - 10×300 - 12×330 - රු. 36,410 ඉහත සඳහන් වැටුප් ව්‍යුහය පූර්ණ වශයෙන් ක්‍රියාත්මක වන්නේ 2020.01.01 දින සිට වේ.

02. *වයස් සීමාව* :

01. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු 45 ට නොවැඩි විය යුතුය. (දැනට ස්ථිර රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ.)

03. *බඳවා ගැනීමේ පොදු කොන්දේසි* :

3.1 අයදුම්කරුවන් ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.

3.2 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ට වැඩි කාලයක් අයදුම්කරු හක්මන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

3.3 අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත විය යුතුය.

3.4 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවෙකු හෝ රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබුවෙකු නොවිය යුතුය.

3.5 සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මඟින් තෝරා ගනු ලැබේ. (දැනට හක්මන ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුක්ත ආදේශක/තාවකාලික/අනියම්/කොන්ත්‍රාත් පදනම මත සේවයේ නියුක්ත වූ අය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)

04. *සේවා නියුක්ත කරලීමේ කොන්දේසි* :

4.1 මෙම තනතුර ස්ථිරය.

4.2 ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් විය යුතුය.

4.3 පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයට යටත් වේ. පරිවාස කාලය තුළ සිය රාජකාරී වැඩ, පැමිණීම හා හැසිරීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්ව තිබේනම් හා අනෙකුත් සේවයේ ස්ථිර කිරීම සඳහා වන අවශ්‍යතාවයන් සම්පූර්ණ කර තිබේ නම් පරිවාස කාලය අවසානයේ සේවයේ ස්ථිර කරනු ලැබේ.

4.4 මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝග වලටද, ආයතන සංග්‍රහය, මුදල් රෙගුලාසි හා ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලටද, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, දකුණු පළාත් සභාව හෝ පළාත් පාලන කොමසාරිස් හා හක්මන ප්‍රාදේශීය සභාව වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝග වලටද, අනුකූලව කටයුතු කිරීමට සියළු සේවකයන් බැඳී සිටිය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :
සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් තෝරාගනු ලැබේ.

06. *අයදුම්කළ යුතු ආකාරය* :

6.1 මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය අනුව A4 ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත සකස් කර 2018.08.13 දිනට පෙර "ලේකම්, හක්මන ප්‍රාදේශීය සභාව, හක්මන." යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

6.2 අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙලවරේ අයදුම් කරන තනතුර ඉතා පැහැදිලිව සඳහන් කළ යුතුය. ("................... තනතුර සඳහා අයදුම්පත")

6.3 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

6.4 අසම්පූර්ණ, අපැහැදිලි මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ද කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

6.5 අයදුම්පත සමඟ පහත සඳහන් ලියකියවිලිවල සහතික කරන ලද පිටපත් එවිය යුතුය :-

(i) උප්පැන්න සහතිකය.
(ii) අධ්‍යාපන සහතිකය.
(iii) පදිංචිය සනාථ කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම සේවා සහතිකය.
(iv) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපත.
(v) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්.
(vi) වසර 03 ට වැඩි පලපුරුද්ද පිළිබඳ සේවා සහතිකය.

07. අයදුම්පත් කැඳවූ පසු හෝ කැඳවන අතරතුරේදී හෝ/හා බඳවා ගැනීම ප්‍රමාද කිරීම හා මෙම නිවේදනය වෙනස් කිරීම සංශෝධනය කිරීමේ බලය හක්මන ප්‍රාදේශීය සභාවේ සභාපති සතු වේ.

වී. පී. කේ. අනුරාධ ප්‍රේමරත්න,
සභාපති,
හක්මන ප්‍රාදේශීය සභාව.

2018 ජූලි මස 02 වැනි දින,
හක්මන ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.

ආදර්ශ අයදුම්පත

**හක්මන ප්‍රාදේශීය සභාව**

01. අයදුම්කරුගේ මුලකුරු සමඟ නම :——————————.

02. මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————.

03. ස්ථිර ලිපිනය :——————————.

04. උපන් දිනය :——————————

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවු :——————. මාස :——————. දින :——————.

05. ජාතික හැඳුනුම්පත් අංකය :——————————

06. ස්ත්‍රී/ පුරුෂ භාවය :——————————

07. විවාහක/ අවිවාහක බව :——————————

08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචි වීමෙන්ද? :——————————

09. අධ්‍යාපන සුදුසුකම් :——————————

10. සේවා පලපුරුද්ද :——————————

11. වෙනත් සුදුසුකම් :——————————

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලබා උසාවියෙන් වරදකරු වී තිබේද? :——————————

13. ඔබ දැනට මෙම ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :——————————

මෙම ඉල්ලුම් පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව ට මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හා පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් මං නුසුදුස්සකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

―――――――――,
අයදුම්කරුගේ අත්සන.

දිනය :―――――――.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*
(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)

.............................................................................. මයා/මිය./මෙනවිය මෙම ආයතනයේ/කාර්යාලයේ ..........................................ලෙස සේවය කරන බවත්, ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, සහතික කරමි.

―――――――――,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :―――――――.

07-718